{සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது / All Rights Reserved / සියලුම හිමිකම් ඇවිරිණි / முழு பதிப்புரிமை உடையது}

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித்திணைக்களம்- வடமத்திய மாகாணம்
**Department of Education – North Central Province**

| ශ්‍රේණිය - 07 | දෙවන වාර පරීක්ෂණය - 2025 | කාලය : පැය 02 |
|---|---|---|

විෂයය :- විද්‍යාව

පාසලේ නම :- ........................................

ඇතුළත්වීමේ අංකය :- ........................................

## I කොටස

➢ **සියලුම ප්‍රශ්ණ වලට ගැලපෙන පිළිතුර තෝරන්න.**

---

01. ශාක වලින් ජලය වාෂ්ප ලෙස පිටවීම කුමන නමකින් හැඳින්වේ ද?
1. උත්ස්වේදනය  2. වාෂ්පීභවනය  3. බිංදුදය

02. ශක්තිය මනින අන්තර් ජාතික ඒකකය වන්නේ,
1. T වේ.  2. J වේ.  3. K වේ.

03. වාතය තුල දී ධ්වනියේ වේගය වන්නේ,
1. තත්පරයට මීටර් 350 කි.  2. තත්පරයට මීටර් 330 කි.  3. තත්පරයට මීටර් 300 කි.

04.  මෙම රූපයේ පෙන්වා ඇති සංකේතය දක්වන උපාංගය කුමක්ද?
1. බල්බය යි.  2. වියළි කෝෂයයි.  3. ධාරිත්‍රකය යි.

05. පහත දී ඇති ද්‍රාවණ අනුව නිල් ලිට්මස් රතු පැහැයට හරවනු ලබන ද්‍රාවණය කුමක්ද?
1. සබන් දියරය  2. දෙහි යුෂය  3. ලුණු ද්‍රාවණය

06. ශාකයක් තුල ආහාර පරිවහනය කරන පටකය වන්නේ,
1. ශෛලම පටකය  2. මැදි පිරවුම් පටකය  3. ප්ලෝයම පටකය

07. ආහාර මාර්ගයටත් ශ්වසන මාර්ගයටත් පොදු ව්‍යුහය වන්නේ,
1. අන්නස්‍රෝතය යි.  2. ආමාශය යි.  3. ශුසනිකාව යි.

08. පුෂ්පයක ජායාංගයට අයත් කොටස වන්නේ,




1. A, C, D
2. A, B, C
3. A, B, D

09. සන්නායකයක් සමඟ චුම්බක බල රේඛා ගැටීමේ දී සන්නායකය තුළ විද්‍යුතය උත්පාදනය වීම හඳුන්වන්නේ,

1. විද්‍යුත් ආකර්ෂන බලය යි.
2. විද්‍යුත් චුම්බක ප්‍රේරණය යි.
3. විද්‍යුත් ගාමක බලය යි.

10. මෙම සරල කෝෂයේ + අග්‍රය හා - අග්‍රය ලෙස යොදා ගන්නා තහඩු වන්නේ,



1. කොපර් හා ඇලුමිනියම් ය.
2. කොපර් හා සින්ක් ය.
3. කොපර් හා යකඩ ය.

11. වායු ගෝලීය ස්ථර අතරින් ඕසෝන් ස්ථරය පිහිටන්නේ,

1. ස්තර ගෝලයේ ය. 2. පරිවර්තී ගෝලයේ ය. 3. මධ්‍ය ගෝලයේ ය.

12. උක් ශාකයේ යුෂයෙහි ඇත්තේ,

1. ග්ලූකෝස් ය. 2. සුක්රෝස් ය. 3. ලැක්ටෝස් ය.

13. උන්නතාංශය වැඩි වන විට උෂ්ණත්වය හා අඩුවන සාධකය කුමක් ද?

1. ජල වාෂ්ප ප්‍රමාණය. 2. වායු ගෝලීය පීඩනය. 3. සුළං ප්‍රවාහය

14. අන්වීක්ෂීය නිරීක්ෂණයේ දී උපනෙත x 10 ලෙසත්, අවනෙත x 40 ලෙසත් සටහන් වී තිබිණි. අන්වීක්ෂයේ විශාලනය කොපමණ ද?

1. 10 x 20 2. 10 x 30 3. 10 x 40

15. මෙහි දක්වා ඇත්තේ, ශාකයක යටි අපිචර්මීය පටකයකි. මෙය,



1. රෝහියෝ පත්‍රයේ යටි අපිචර්මය යි.
2. බුලත්වල පත්‍ර යටි අපිචර්මය යි.
3. ලූනු වල පත්‍ර යටි අපිචර්මය යි.

16. 

මෙම සටහන මගින් කුමන ආලෝක කදම්භයක් නිරූපණය කරයි ද?

1. සමාන්තර 2. අභිසාරී 3. අපසාරී

17. තල දර්පණ දෙකක් අතර කෝණය අංශක 60ක් වන විට සෑදෙන ප්‍රතිබිම්බ සංඛ්‍යාව වන්නේ,

1. 5 කි. 2. 6 කි. 3. 7 කි.

18. පෘථිවියේ ප්‍රාවරණයේ ඝනකම කොපමණ ද?

1. 2350 km  2. 2500 km  <u>3. 2900 km</u>

19. වියළි කෝෂයකින් විද්‍යුතය නිපදවීමේ දී සිදුවන ශක්ති පරිවර්තනය වන්නේ,

1. රසායනික ශක්තිය - ආලෝක ශක්තිය

<u>2. රසායනික ශක්තිය - විද්‍යුත් ශක්තිය</u>

3. රසායනික ශක්තිය - චාලක ශක්තිය

20. භූ තැටි මායිම් ආශ්‍රිතව සිදු විය හැකි සංසිද්ධිය කුමක් ද?

1. වර්ෂා ඇති වීම.  2. සුළං ඇතිවීම.  <u>3. භූ කම්පන ඇතිවීම.</u>

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නයට අනිවාර්යයෙන් පිළිතුරු ලිවිය යුතු යි.**
- **2, 3, 4, 5, 6 යන ප්‍රශ්න වලින් ප්‍රශ්න හතර (04 කට) පිළිතරු ලියන්න.**
- **ප්‍රශ්න පත්‍රයේහි පිළිතුරු ලියන්න.**

---

01. පහත ප්‍රකාශ නිවැරදි නම් ✓ ලකුණ ද වැරදි නම් X ලකුණ ද වරහන් තුළ සොදන්න.

| | | |
|---|---|---|
| I. | කොඳු ඇට පෙළක් ඇති සතුන් අපෘෂ්ඨවංශීන් ලෙස හැඳින්වේ. | (X) |
| II. | වායු ගෝලයේ පරිමාව අනුව 78% ක් නයිට්‍රජන් වායුව ඇත. | (✓) |
| III. | අන්වීක්ෂයේ ප්‍රාචීරය මගින් නිදර්ශකය වෙත ළඟාවන ආලෝක ප්‍රමාණය පාලනය කරයි. | (✓) |
| IV. | තල දර්පණයකින් සෑදෙන ප්‍රතිබිම්බය තිරයක් මතට ගත හැකිය. | (X) |
| V. | වාහන වල පැති කණ්නාඩිය අවතල දර්පණයකි. | (X) |
| Vi. | සූර්යයා හා පෘථිවිය අතරට චන්ද්‍රයා පැමිණි විට සූර්ය ග්‍රහණයක් ඇති වේ. | (✓) |
| Vii. | පෘථිවියේ අප ජීවත්වන කොටස පෘථිවි හරය ලෙස හැඳින්වේ. | (X) |
| Viii. | චලනය වන වස්තුවක් සතු ශක්තිය චාලක ශක්තියයි. | (✓) |
| ix. | සලබයා පරිසරයට අනුවර්තනය විය හැකි සතෙකි. | (✓) |
| x. | මී තයිල් ඔරේන්ජ්, අම්ල හමුවේ දී කහ පාට වර්ණය පෙන්වයි. | (X) |
| xi. | සියලුම විදුලි කෝෂ මගින් සරල ධාරාවක් ලබා ගත හැකිය. | (✓) |
| xii. | ස්ථිති විද්‍යුත් ආරෝපණ වර්ග 03ක් ඇත. | (X) |

(ලකුණු 1 x 12 = 12)

02. පහත දී ඇති වාක්‍ය සඳහා ගැලපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.
(වාතය, දෙබෙදුම් සුචි, සුනාමි, ද්වි උත්තල, පාංශු ඛාදනය, ගල් අඟුරු, අයඩීන්, උභය ජීවී, සෛලය, පරීක්ෂය, මල බද්ධය, අනුකූල)

I. සරල අන්වීක්ෂයක ඇත්තේ, **ද්වි උත්තල** කාචයකි.
II. ජීවීන් කාණ්ඩ කිරීම සඳහා **දෙබෙදුම් සුචි** භාවිතා කළ හැකිය.
III. බටනලාවක ධ්වනිය ඇතිවන්නේ **වාතය** කම්පනය වීමෙනි.
IV. මුහුදු පතුලේ සිදුවන සමහර භූ තැටි චලන වල දී **සුනාමි** තත්වයක් ඇති විය හැකිය.
V. කිසියම් හේතුවක් නිසා මතු පිට පස ඉවත් වී යාම **පාංශු ඛාදනය** ලෙස හඳුන්වයි.
VI. **ගල් අඟුරු** පොසිල ඉන්ධනයකි.
VII. ලුනු හා මුහුදු ආහාරවල **අයඩීන්** අඩංගු වේ.
VIII. තන්තු සහිත ආහාර ගැනීමෙන් **මල බද්ධය** වළක්වයි.
IX. පක්ෂීන්ගේ ශරීරයේ **අනුකූල** හැඩයක් පැවැතීම නිසා සංචරණය පහසු කරයි.
X. ජීවී දේහයේ තැනුම් ඒකකය **සෛලය** යි.
XI. ගෙම්බා, මැඬියා **උභය ජීවී** සත්තව කාණ්ඩයට අයත් වේ.
XII. පහළ මට්ටමක සිට ඉහළ මට්ටමක සිදුවන දේ නිරීක්ෂණය කිරීමට **පරීක්ෂය** භාවිතා කළ හැකිය.

(ල. 1 x 12 = 12)

03.

i. අප අවට පරිසරයේ දක්නට ලැබෙන සපුෂ්ප ශාක වර්ග 02 ක් සහ අපුෂ්ප ශාක වර්ග 02 ක් ලියන්න.

සපුෂ්ප ශාක　　　　　　　　　　අපුෂ්ප ශාක

**සුදුසු සපුෂ්ප හා අපුෂ්ප ශාක දෙකකට ලකුණු ලබා දෙන්න**

ii. ශාකයක වැදගත් කොටසක් වන මූල පද්ධතියක රූප සටහනක් පහත දැක්වේ.



මෙම මූල පද්ධතිය ඇති ශාකයේ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ 02 ක් ලියන්න.

**1. ජාලාභ නාරටි වින්‍යාසයක් ඇත.**

**2. බීජයේ පියලි දෙකක් ඇත/කඳ අතුවලට බෙදී ඇත.** (ල. 02)

iii. බීජයක තිබෙන බීජ පත්‍ර සංඛ්‍යාව අනුව ශාක වර්ග කළ හැක. ඒවා නම් කරන්න.

**1. ඒක බීජ පත්‍රී ශාක**　　**2. ද්වි බීජ පත්‍රී ශාක** (ල. 02)

iv. එම ශාකවල බීජ ප්‍රරෝහණය වන විට දක්නට ලැබෙන වෙනස්කම් රූප සටහන් මඟින් දක්වන්න.





(ල. 02)

v. පහත දැක්වෙන ශාක කොටස් තිබෙන ශාකය බැගින් නම් කරන්න.

(a). සුළඟේ පාවෙන පියාපත් සහිත බීජ **හොර**

(b). ජලය ගබඩා වී ඇති පත්‍ර තිබීම. **කෝමාරිකා/ අක්කපාන**

(c). කයිරු මුල් දැකිය හැකි වීම. **වැටකෙයියා / රම්පේ**

(d). ශාක මුල්වල මූල ගැටිති පිහිටා තිබීම. **නිදිකුම්බා/දඹල/බෝංචි/මෑ(රනිල කුලයේ ශාක)**

(ල. 04)

04. මිහිමත ජීවත්වන ජීවීන්ට ජලය යනු වටිනාම සම්පතකි.

i. ජලයේ දැකිය හැකි ප්‍රධාන ගුණ 02 ක් ලියන්න.

**1. ද්‍රාවක ගුණය** **2. සිසිලන කාරක ගුණය** (ල. 02)

ii. පහත දැක්වෙන අවස්ථාවල දී භාවිත වන්නේ ජලයේ කුමන ගුණය දැයි ලියන්න.

1. සේලයින්, එන්නත් වැනි දෑ නිපදවීම. **ද්‍රාවක ගුණය**
2. රෙදි පිළිවල කුණු ඉවත් කිරීම. **ද්‍රාවක ගුණය**
3. වාහනවල රේඩියේටරයට ජලය දැමීම. **සිසිලන කාරක ගුණය**
4. උණුසුම් තේ කෝප්පයක් ජල බඳුනක තබා නිවා ගැනීම. **සිසිලන කාරක ගුණය**

(ල. 04)

iii. නිවසේ තිබෙන ද්‍රව්‍ය/ ද්‍රාවණ කිහිපයක් පහත දැක්වේ. ඒවා ඇසුරින් වගුව පුරවන්න.

විනාකිරි, සබන්, ආප්ප සෝඩා, ජලය, මිල්ක් ඔෆ් මැග්නීසියා, හුණු, දෙහි යුෂ, භූමිතෙල්

| අම්ල | භස්ම | උදාසීන ද්‍රව්‍ය |
|---|---|---|
| **විනාකිරි**<br>**දෙහි යුෂ** | **සබන්**<br>**ආප්ප සෝඩා**<br>**මිල්ක් ඔෆ් මැග්නීසියා**<br>**හුණු** | **ජලය**<br>**භූමිතෙල්** |

(ල. 03)

iv. පහත දැක්වෙන දැක්වෙන දර්ශක අම්ල වල දී සහ භෂ්ම වල දී පෙන්වා නිරීක්ෂණ ලියන්න.

| දර්ශකය | | අම්ල | භස්ම |
|---|---|---|---|
| රතු ලිට්මස් පත්‍ර | - | **රතු** | **නිල්** |
| පිනෝප්තලින් | - | **අවර්ණ** | **රෝස** |
| PH පත්‍ර | - | **රතු,තැඹිලි, කහ** | **තද කොළ,නිල්,දම්** |

(ල. 03)

05. අවතල දර්පණයක් ඉදිරියේ ස්ථාන දෙකක දැල් වූ ඉටිපන්දමක් තැබූ අවස්ථා 02 ක් පහත රූප සටහන් වල දැක්වේ.



මෙම අවස්ථා දෙකේ ප්‍රතිබිම්භ සෑදෙන ආකාරය වගුවේ සටහන් කරන්න.

| අවස්ථාව | තිරණයකට ගත හැක, නොහැක. | උඩු කුරු / යටි කුරු | ප්‍රතිබිම්භයේ ප්‍රමාණය. |
|---|---|---|---|
| 1. | **නොහැක.** | **උඩු කුරු.** | **වස්තුවට වඩා විශාලයි.** |
| 2. | **ගත හැක.** | **යටි කුරුයි.** | **වස්තුවට වඩා කුඩායි.** |
| | | | |

(ල. 03)

ii. අවතල දර්පණ භාවිතවන අවස්ථා 02 ක් ලියන්න.

1. **සූර්ය උඳුන් සකස් කිරීමට.**
2. **දන්ත වෛද්‍යවරුන්ට රෝගීන්ගේ දත් පරීක්ෂා කිරීමට** (ල.02)

B)

i. විදුලිය උත්පාදනය වන ක්‍රමය අනුව විද්‍යුත් ප්‍රභව වර්ග කළ හැක. එම ප්‍රභව 02 ක් ලියන්න.

1. **විද්‍යුත් කෝෂ හා බැටරි**
2. **ඩයිනමෝව**

**සූර්ය කෝෂ** (ල. 02)

ii. විද්‍යුත් ප්‍රභව වලින් නිපදවන විදුලිය ආකාර 02 කට වර්ග කරයි. ඒවා නම් කරන්න. උදාහරණ 1 බැගින් ලියන්න.

1. **සරල ධාරාව** උදාහරණ - **විදුලි කෝෂ, බැටරි**

2. **ප්‍රත්‍යාවර්ත ධාරාව** උදාහරණ - **ඩයිනමෝව, විදුලි ජනක**

(ල. 02)

iii. බයිසිකල් ඩයිනමෝවක ඇතුළත පෙනුම දක්වෙන රූප සටහනක් පහත දක්වේ. එහි A. B. C කොටස් නම් කරන්න.




A - **කැරකෙන රෝදය**

B - **ස්ථිර චුම්බකය**

C - **කම්බි දඟරය**

(ල. 03)

06.



i. ඉහත රූප සටහන් වල සිටින සතුන් පෘෂ්ඨවංශී, අපෘෂ්ඨවංශී ලෙස වර්ග කරන්න.

පෘෂ්ඨවංශී - **කපුටා, කැස්බෑවා**

අපෘෂ්ඨවංශී - **සමනළයා, ගොළුබෙල්ලා**

(ල. 02)

ii. පරිසරයේ සිටින වේශාන්තරණය දක්වන සතුන් 04 දෙනෙකුගේ නම් ලියන්න.

**සමනළයා** **තණකොළපෙත්තා**

**දළඹුවා** **ඇහැටුල්ලා** **කටුස්සා**

(ල. 02)

iii. පහත දී ඇති සතුන් දෙබෙදුම් සුචියක් මඟින් වර්ග කරන්න.

(ගෙම්බා, නයා, මාළුවා, කුකුළා)

- පාද ඇත (ගෙම්බා, කුකුළා)
  - දේහාවරණයේ පිහාටු ඇත. (කුකුළා)
  - දේහාවරණයේ පිහාටු නැත (ගෙම්බා)
- පාද නැති (මාළුවා, නයා)
  - දේහය අනාකූල හැඩය ඇත (මාළුවා)
  - දේහය අනාකූල නැත (නයා)

(ල. 04)

iv.




A නාස් කුහරය

B ස්වරාලය

C ශ්වාස නාලය

D පෙනහල්ල

ඉහත දැක්වෙන්නේ මිනිසාගේ ශ්වසන පද්ධතියේ රූප සටහනකි. එහි A, B, C, D ව්‍යුහ නම් කරන්න.

(ල. 02)

v. මිනිසාගේ ශ්වසනය සිදු වීමට අවශ්‍ය වන සාධක මොනවාද?

සරළ ආහාර

ඔක්සිජන්

(ල. 02)

(මුළු ලකුණු 12)